## නිර්වචනාත්මක හැඳින්වීම

# ජාතික සංහිඳියාව ගොඩනැංවීමෙහි ලා සංස්කෘතිකාන්තර හුවමාරුවේ භූමිකාව

ආචාර්ය වියුඩර් වීරසිංහ, මණ්ඩපාධිපති
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

මානවයාගේ සමාජ පරිණාමයේදී සංස්කෘතික සාධක සමාජ සංවර්ධනය සඳහා පමණක් නොව ඔවුනොවුන් අතර අන්තර් සම්බන්ධතා නව ගුණාත්මක තලයක් ඔස්සේ සංවර්ධනය වීම කෙරෙහිද තීරණාත්මක ලෙස බලපා තිබේ.

මිනිසාගේ සංස්කෘතික ජීවිතය ඔහුගේ පැවැත්මේ සහ ක්‍රියාකාරීත්වයේ සියලුම ක්ෂේත්‍රවලට බලපා ඇති අතර එක් අතකින් තියුණු හා ගැඹුරු සමාජ අර්බුද නිරාකරණය කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් ද අනෙක් අතින් සමාජ ගැටුම් හා අර්බුද උත්සන්න කිරීමේ සාධකයක් වශයෙන් ද ඉතිහාසය පුරාම ක්‍රියාකර ඇති ආකාරය දැකිය හැකිය. එහෙත් තවමත් ''සංස්කෘතික සාධකය'' මගහැර මේ යුගයේ කිසිදු වැදගත් ජාතික හා ගෝලීය පමණක් නොව පුද්ගල හෝ කණ්ඩායම් ප්‍රශ්නයක්වත් විසඳිය නොහැකි තත්ත්වයට සංස්කෘතික සාධයකය ගතික සහ සකලවිද ක්ෂේත්‍ර ඔස්සේ විහිදී ගිය සාධකයක් බවට පත්ව තිබේ.
වර්තමාන ලෝකයේ ජීවත් වන ජනගහනය කෝටි 720 ක් පමණ





වන අතර එය ජාතීන්, වාර්ගික කණ්ඩායම්, ජාතිකත්වය ආදී සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික ගති ලක්ෂණ දරන එකිනෙකට වෙනස් ඒකක සිය දහස් ගණනකින් සමන්විතය. මෙම ඒකක අතර සංකීර්ණ වූ ද ප්‍රතිවිරෝධී වූ ද අරගලකාමී වූ ද තරඟකාරී වූ ද සම්බන්ධතා මෙන්ම, සාමකාමී වූ ද සහජීවනාත්මක වූ ද සමෝධානාත්මක වූ  සංහිඳියාත්මක වූ ද සම්බන්ධතා පොදුවේ ක්‍රියාත්මක වන අතර එය ''මානව සංහතිය '' ලෙස, ඒකීය සමාජයක් ලෙස සිය ජීවන අරගලය පෘථිවිය මත පවත්වා ගෙන යන ආකාරය දැකිය හැකිය. විද්‍යාවේ, තාක්ෂණයේ හා ආර්ථිකයේ වර්ධනයත් සමග ම සිය පැවැත්ම සඳහා වූ මානව වර්ගයාගේ අරගලය තිව්‍ර හා සංකීර්ණ වූවා මිස, එය සංතුලන තත්ත්වයට පැමිණියේ නැත.

මානව වර්ගයාගේ ඉතිහාසය තුළ මානව, ජාතික, වාර්ගික, සංස්කෘතික සම්බන්ධතා තරම් සංකීර්ණ වූ ද සමහර විට පොදු විද්‍යාත්මක රාමුවකට ගොනුකළ නොහැකි වුව ද බොහෝ විට මනෝ මූලික ප්‍රවණතාමක් දරන්නා වූ ද එක් අතකින් එය නිරාකරණය කිරීම අනෙක් අතින් ඊට ප්‍රතිවිරෝධී ක්‍රියාවක් ඇති කරන්නා වූ ද වෙනත් සංකීර්ණ ප්‍රපංචයක් ඉතිහාසයේ දැකීම දුෂ්කරය. නමුත් මෙහිදී අපගේ ප්‍රයත්නය වන්නේ බැලූ බැල්මටම මානව කණ්ඩායම් අතර, ජාතීන් අතර, ජන වර්ග අතර ගැටුම් හා පරස්පරතාවලට තුඩු දෙන්නා වූ සංස්කෘතික සාධකය ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලයක් ඇති කිරීම සඳහා භාවිතයට ගැනීමේ සක්‍යතාව ගවේෂණය කිරීමයි. ඒ අනුව ජාතික සහජීවනය ජනවාර්ගික සංහිඳියාව ඇති කිරීමෙහි ලා අන්තර් සංස්කෘතික ක්‍රියාවලියේ ශක්‍යතාව සහ එය උපාය මාර්ගිකව හැසිරවීමේ හැකියාව සොයා බැලීමයි.

ඇත්ත වශයෙන් ම අන්තර් සංස්කෘතික සන්නිවේදනයේ අවශ්‍යතාව බිහිවන්නේ අහඹුවෙන් නොව, එය මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ වර්ධනයේ නිශ්චිත මට්ටමකදී බිහි වූ අතර එය මූලික වශයෙන් 20 වැනි සියවසේ මධ්‍ය භාගයේ දී, එනම් 1950 ගණන්වලදී සංකල්පමය වශයෙන් බිහි වූ බව සඳහන් කළ යුතුය.
අන්තර් සංස්කෘතික හෝ සංස්කෘතිකාන්තර සන්නිවේදනය බිහිවීම

සහ වර්ධනය වීම කෙරෙහි රාජ්‍ය, නගර සහ ජාත්‍යන්තර ආදී ක්ෂේත්‍රවල වර්ධනය වූ සම්බන්ධතා දැක්විය හැකි අතර විශේෂයෙන්, ආර්ථික, දේශපාලන, සමාජ, ආගමික, කලාත්මක හා අධ්‍යාපන යන ක්ෂේත්‍රවල සිදු වූ තියුණු හා වේගවත් වර්ධනයක් පෙන්වා දිය හැකිය.

මෙම ක්‍රියාවලිය මානව සංහතිය වර්ධනයේ නව තලයකට ප්‍රවිශ්ට කළ අතර එය වර්තමානයේදී ජනප්‍රිය වූ දෘෂ්ටිවාදී සංකල්පයක් වන ''ගෝලීයකරණය '' ලෙස හැඳින්වේ. වර්තමාන ලෝකයේ ගෝලීයකරණය ලෙස සිදුවන මෙම ක්‍රියාවලියේ හරය ඉතා ප්‍රබල ප්‍රතිවිපාක ගෙන දීමට සමත් වී ඇති අතර එය එක් අතකින්, එකම වේලාවේ විවිධ සංස්කෘතීන් හා විවිධ ජනවර්ග ඒකාබද්ධ කිරීම මෙන් ම ජාතීන් අතර, වාර්ගික ගැටුම්, ප්‍රතිවිරෝධතා උත්සන්න කරන ප්‍රබල සාධකයකි.

අද්‍යතන ගෝලීයකරණ ස්වරූපයෙන් සිදුවන ''බටහිරකරණ '' ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස, ජාතික, වාර්ගික මෙන්ම ආගමික හා සංස්කෘතික ප්‍රතිවිරෝධතා උත්සන්න වී ඇති අතර එම සමහර ගැටුම් සහ අර්බුද රාජ්‍ය අභ්‍යන්තර ව්‍යුහයේ බිඳ වැටීම දක්වා ද එසේම රාජ්‍ය අතර අන්තර් සම්බන්ධතා බිඳ වැටීම දක්වා වර්ධනය වීමේ යථාර්ථවාදී තර්ජනයක් පවතී. මෙම තත්ත්වය සමකාලීන දේශපාලන ලිබරල්වාදයට, ප්‍රජාතන්ත්‍රවාදයට. තාක්ෂණික අභිසාරීතාවාදයට, ආර්ථික වෙළෙඳපොළවාදයට විසඳීමට නොහැකි වී ඇති අවස්ථාවකදී ''සංස්කෘතිකාන්තරවාදයට'' අන්තර් සංස්කෘතික හුවමාරුවට සහ සංස්කෘතිකාන්තර සන්නිවේදනයට විසඳීමට ඇති ශක්‍යතාව ගවේෂණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

ශ්‍රී ලංකාවේ මෙවැනි ජනවාර්ගික ගැටුම් ශක්‍යතා අවසානයේදී සමාජ, දේශපාලන අර්බුදයක් දක්වා පමණක් නොව සංග්‍රාමයක් දක්වා ද වර්ධනය වී සමාජ පරිණාමය වෙනත් ඓතිහාසික වශයෙන් ගුණාත්මක තලයකට අවතීර්ණ වුව ද ජාතික, වාර්ගික ගැටලුවේ ස්වභාවය වෙනස් නොවී එලෙස ම පවතී. ශ්‍රී ලංකාවේ නොදියුණු, ඌන සංවර්ධිත දේශපාලන සංස්කෘතියට මෙම අන්තර්





වාර්ගික ගැටලුව විසඳීමට නොහැකි වීම ඓතිහාසික සහ සමාජයීය කොන්දේසි මත තත්වාරෝපිත වී ඇති බව සඳහන් කළ යුතු ය.

දශක තුනක් තිස්සේ පැවැති සිවිල් යුද්ධය අවසානයේ මෙම ගැටලුවට විසඳුමක් ලබාදීමට සමත් නොවූ අතර එම ගැටලුව වෙනත් තලයකට ගෙන යාමට පමණක් එය සමත් විය. යුද්ධයේ අවසානය ''වාර්ගික ගැටලුවේ නිමාව ලෙස අර්ථකථනය කිරීම'' දෘෂ්ටිවාදී සහ දේශපාලන අස්ථානයක් මිස එය දෘෂ්ටිවිද්‍යාත්මක හෝ යථාර්ථවාදී ස්ථාවරයක් නොවේ.

මානව සමාජයේ සංස්කෘතිකාන්තර ක්‍රියාවලිය සහ සංස්කෘතිකාන්තර සන්නිවේදන ක්‍රියාවලිය දේශපාලන ක්‍රියාවලියකට වඩා ජනමූලයන් ස්පර්ශ කරන අතර ඊට සමාජයෙහි වාර්ගික ගැටලුව විසඳීමෙහි ලා ඇති හැකියාව ද අවතක්සේරු කළ නොහැකි ය. මෙම තත්ත්වය තුළ අදාළ ගැටලු විසඳීම සඳහා නව ක්‍රම ශිල්පවේද මාධ්‍යයන් කෙරෙහි නිතැතින්ම අප අවධානය යොමු වන්නේ ය. එම නිසා මෙහිදී සංස්කෘතිකාන්තර සන්නිවේදනාත්මක ස්වභාවයක් දරන සුවිශේෂ මාධ්‍යයන් කෙරෙහි අවධානය යොමු කිරීම අතිශය වැදගත් වන්නේ ය.

මානව වර්ගයාගේ ඉතිහාසයේ සංස්කෘතික පරිණාමය දෙස බලන විට සංස්කෘතිකාන්තර සන්නිවේදනය සහ සංස්කෘතිකාන්තර හුවමාරු පිළිබඳව එකිනෙකට ප්‍රතිවිරෝධී ප්‍රවණතා දෙකක් ගොඩනැගී ඇති බව පැහැදිලි වේ. ඉන් එක් ප්‍රවණතාවක් වන්නේ වෙනත් සංස්කෘතීන්වල ඇති ප්‍රගතිශීලී නවීකාරක වටිනාකම් සහ ජයග්‍රහණ අත්පත් කර ගැනීම සඳහා පවතින්නා වූ ප්‍රයත්නය වන අතර, අනෙක වන්නේ තම සංස්කෘතියේ ඇති වටිනාකම් සහ පුරුෂාර්ථ ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන්ය. මේ ප්‍රවණතා අතර පවත්නා ගැටුම් හා සම්බන්ධතාව අද්‍යතන එක් එක් ජාතික සංස්කෘතීන්වල ස්වරූපය හා හැසිරීම මෙන්ම පොදුවේ ගෝලීය සංස්කෘතියේ සමකාලීන තත්ත්වය තීරණය කරන බව පෙනේ.

මෙම සංකීර්ණ ගැටලුවට පිළිතුරු සෙවීම සඳහා ගන්නා උත්සාහයේ

ප්‍රතිඵලයක් වශයෙන් අන්තර් සංස්කෘතික ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය අධ්‍යනය කිරීම සඳහා වන විද්‍යාවක අවශ්‍යතාව ඉස්මතු වූ අතර එය ''සංස්කෘතිකාන්තර සන්නිවේදනය '' Cross - Cultural Communication ලෙස ප්‍රකාශයට පත්විය. මෙහි මුඛ්‍ය අරමුණ වූයේ ඒ ඒ ජන සංස්කෘතිවල අවශ්‍යතා සලකා බලා ඒවා වෙනත් සංස්කෘතීන් සමග කටයුතු කිරීමේදී සන්නිවේදනයේදී වඩාත් සාර්ථක ලෙස භාවිතයට ගැනීමේ හැකියාව අධ්‍යනය කිරීම යි.

සංස්කෘතිකාන්තර සන්නිවේදනය උපත ලබන්නේ අමෙරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ සහ ව්‍යාපාරික ක්ෂේත්‍රය පාදක කොට ගෙන ය. 1950 දශකය තුළ අන්තර් සංස්කෘතික සන්නිවේදනය පිළිබඳ කෘති කිහිපයක් ප්‍රකාශයට පත් වූ අතර එම කෘතීන් හි මූලික අදහස වූයේ සංස්කෘතිය සන්නිවේදනයෙන් ද සන්නිවේදනය සංස්කෘතියෙන් ද වෙන් කළ නොහැකි බව යි. ඒ අනුව ''සංස්කෘතිය සන්නිවේදනය වන අතර සන්නිවේදනය සංස්කෘතිය වන්නේ යැයි '' ඔවුහු පැහැදිලි කළහ.

සංස්කෘතිකාන්තර සන්නිවේදනය ආරම්භ වන්නේ විවිධ සංස්කෘතීන් අතර වෙනස්කම් සංජනනය සහ පිළිගැනීම තුළ බව සඳහන් කළ යුතුය. විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයින් අතර සන්නිවේදනයේ අරමුණ වන්නේ ඒවා අතර පවත්නා වෙනස්කම් මැඩපැවැත්වීම වන අතර අදාළ සන්නිවේදනය තුළ මිනිසුන් අතර මනා අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩනැගීම ය. අන්තර් සංස්කෘතික හුවමාරුවේදී විවිධ මිනිසුන් අතර පවත්නා සංස්කෘතික වෙනස්කම් හීන වී යන අතර එදිරිවාදිකම් වල සිට ස්වේච්ඡාගත සවිඥානික සම්මුතීන්ට පැමිණෙන්නේ ය.

විවිධ මිනිසුන් අතර ස්වභාවික හා සමාජයීය වෙනස්කම් පැවැතීම පිළිගැනීම සෑම පුද්ගලයෙකු තුළම තමන්ට ආවේනික වූ චින්තනයක් සහ චර්යා මාදිලියක් පවතින බව පිළිගැනීමට අපව යොමු කරන්නේ ය. එය සංස්කෘතිකවේදාත්මක සාධක සංකීර්ණයක් මගින් තත්ත්වාරෝපණය කරන අතර එම විශේෂතා සැලකිල්ලට ගැනීම අන්තර් සංස්කෘතික සන්නිවේදනයෙහි අපේක්ෂිත සාර්ථකත්වයට





ළඟා වීමට හේතු වන්නේ ය.

ශ්‍රී ලාංකේය සමාජ සහ සංස්කෘතික ඉතිහාසය තුළ ''සංස්කෘතික විසර්ජනය'' ''සංස්කෘතික සම්මිශ්‍රණය'' ''සංස්කෘතික රෝපණය '' සංස්කෘතිකාන්තීකරණය'' ආදි විවිධ වූ, සමහර විට එකිනෙකට පරස්පර වූ ප්‍රවණතා ක්‍රියාත්මක වී ඇති අතර සමහර කාලවලදී සංස්කෘතිකාන්තර ආකර්ෂණය මෙන්ම සංස්කෘතිකාන්තර විකර්ෂණය ද ප්‍රබල වී ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාවේ සමාජය වැනි බහුසංස්කෘතික, බහුභාෂීය හා බහුසමාජයීය සමාජයක විවිධ සංස්කෘතීන් අතර සහජීවනය සහ සංහිඳියාව ඇති කරන පොදු සංස්කෘතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වන්නේය.

ශ්‍රී ලංකාව තුළ දශක ගණනාවක් පුරා සිදුවන අන්තර්වාර්ගික, අන්තර්සංස්කෘතික, අන්තර්භාෂික පරස්පරතා, ප්‍රතිවිරෝධතා හා ගැටුම්කාරී ප්‍රවණතා විසඳා ගැනීම සඳහා අපගේ සුවිශේෂ අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍රයක් වශයෙන් මෙම සංස්කෘතිකාන්තර හුවමාරුවට, සංස්කෘතිකාන්තර සංසරණයට, සංස්කෘතිකාන්තර ආශ්‍රයට, සංස්කෘතිකාන්තර සන්නිවේදනයට, සංස්කෘතිකාන්තර සංහතික මාධ්‍යකරණයට ආදි සංස්කෘතිකාන්තර සම්බන්ධතා ප්‍රවර්ධනය කරන, ශක්තිමත් කරන ජාතික ප්‍රතිපත්තියකට ගමන් කිරීම අතිශයින් වැදගත් වන්නේය. එය ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන හා පරිපාලන ක්ෂේත්‍ර තුළ විසඳුම් සොයන තරමට වැදගත් බව අවධාරණය කළ යුතුය.

මෙහිදී අප වටහා ගත යුතු මුඛ්‍ය තත්ත්වයක් වන්නේ ජනවාර්ගික හා ජාතික ප්‍රශ්නවලට බහුවිධ මානයන් හා පැතිකඩ පවතින බවත් ඒවා විසඳීමේදී එක් ප්‍රවේශයක් ඔස්සේ පමණක් නොව බහුමානික හෝ සාකල්‍යමය ප්‍රවේශයක් ඔස්සේ එය නවීකරණය කර ගැනීමට ප්‍රයත්න දැරීමට වඩා ප්‍රායෝගික වන බවයි.

මෙහිදී සංස්කෘතික මානය, ප්‍රවේශය විශේෂයෙන්ම සංස්කෘතිකාන්තර

මාධ්‍යය වඩාත් පදනම් සහිත විශ්වාසනීය ප්‍රවේශයක් වන්නේ එය ජනතාවගේ ඓතිහාසික සංස්කෘතික උරුමයත්, වසර සිය ගණනක් තිස්සේ විවිධ ජනවර්ග හා ජාතීන් ඔවුනොවුන්ගේ සමාජ ජීවන මාදිලය තුළ ගොඩනගා ගත් සාධනීය ප්‍රගතිශීලී හා සමූහික වටිනාකම් සහ අත්දැකීම් පද්ධතියත් හේතු කොට ගෙනය.

ජාතීන් අතර සංහිඳියාව සහ වාර්ගික සහජීවනය ඇති කරලීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයෙහි තීරණාත්මක පරිවර්තනයක් සිදුවිය යුතුය. ශ්‍රී ලංකාව වැනි රටක, සමාජය ජාතික ප්‍රතිපත්තිය තුළ සැලකිය යුතු ස්ථානයක් සංස්කෘතික - මානසික ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තියට හිමිවිය යුතු බව පෙන්වා දිය යුතුය.

මිනිසා මුහුණ දෙන බොහෝ මූලික ප්‍රශ්නවලට මුඛ්‍ය සාධක ද්විත්වයක් වන්නේ ආර්ථිකය සහ සංස්කෘතියයි. බහුවාර්ගික, බහුජාතික සමාජයක මේ සාධක දෙක ජාතික මට්ටමින් නිය-ාමනය කිරීමේ, සැලසුම් කිරීමේ කාර්ය අතිශයින් වැදගත් වන්නේය. විශේෂයෙන් මෙහිදී සංස්කෘතික සාධකය වඩාත් සංවේදි බව අවධ-ාරණය කළ යුතු වන්නේය.

ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුවේ ඉතිහාසය තුළ ජනවර්ග, ජාතීන් අතර සහජීවනය සහ සංහිඳියාව ඇතිකරලීම සඳහා සංස්කෘතික සාධකය සංස්කෘතිකාන්තර ප්‍රවේශයක් ඔස්සේ භාවිතයට ගැනීම පිළිබඳව විශාල අවධානයක් යොමුවී නැති බව පෙනේ. වර්තමානයේදී ජාතික වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද සංස්කෘතික ක්ෂේත්‍රයෙහි ගතික හා ප්‍රවණතා වඩාත් සක්‍රිය වී ඇති මොහොතක මෙම ගැටලුව සම්බන්ධව ඊට අවධානය යොමු වීම කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දිය යුතුය.

ශ්‍රී ලංකාවේ වාර්ගික, සංස්කෘතික සංයුතිය ලෝකයේ වෙනත් රටවල මෙන් සංකීර්ණ ස්වභාවයක් ගන්නේ නැත. වෙනත් බහුවාර්ගික හා බහුසංස්කෘතික සමාජ ජාතික සංහිඳියාව සඳහා සිය සංස්කෘතික ප්‍රතිපත්තිය සහ සංස්කෘතික දේශපාලනය ක්‍රියාත්මක කර ඇති ආකාරය අධ්‍යනය කිරීමෙන් විශාල දැනුමක් මෙන්ම





අත්දැකීම් සම්භාරයක් ලබාගත හැකිය. මානව වර්ගයා සිය සමාජ පරිණාමයේදී සංස්කෘතිකාන්තර හුවමාරුව සහ සංස්කෘතිකාන්තර සන්නිවේදන ක්ෂේත්‍රයෙහි අත්පත් කොට ගෙන ඇති දැනුම සහ අත්දැකීම් ප්‍රතික්ෂේප කොට හුදු අපටම ආවේනික වූ ක්‍රමවේදයකට පමණක් මෙම ගැටලුව නිරාකරණය කිරීමට කිසිසේත්ම කළ නොහැකිය.

අන්තර්වාර්ගික සම්බන්ධතා සහ සුහදතාව අන්‍යෝන්‍ය වශයෙන් පෝෂණය වීමේ ප්‍රවණතාව දෙසට යොමු වූ අපට පවතින සංස්කෘතික ශක්‍යතා හා ගතික උත්කර්ෂණය කිරීමට සමත් බහුසංස්කෘතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු වීම කාලීන හා ජාතික අවශ්‍යතාවකි.

මෙහිදී අප ඉහත ගෙන හැර දක්වන ලද සංස්කෘතික දේශපාලනයේ හෝ සංස්කෘතික ප්‍රතිපත්තියේ දාර්ශනික පදනම වශයෙන් ''සංස්කෘතික සාපේක්ෂතාවාදය'' ගත යුතු බව අපගේ අදහසයි. රම සංස්කෘතික ප්‍රතිපත්තිය අප පිළිගැනීම තුළ සංස්කෘතිකාරෝපණය, සංස්කෘතික ආන්තිකරණය, සංස්කෘතික කොන්වීම ආදි අන්තර් සංස්කෘතික ක්ෂේත්‍රයෙහි මතුවිය හැකි නිශේධනාත්මක ගැටුම් සඳහා මුල පුරන ප්‍රවණතා දුර්වල වී සංස්කෘතිකානුකලනය, සංස්කෘතික මිශ්‍රණය, අන්‍යෝන්‍ය සංස්කෘතිකාවර්තනය, සංස්කෘතිකාන්තර විසරණය, ආදි අන්තර් සංස්කෘතික ක්ෂේත්‍රයෙහි කාලීන ධනාත්මක සහජීවනාභිමුඛ ප්‍රවණතා උත්කර්ෂණය වී සමාජය තුළ දියුණු සංස්කෘතික විඥාපනයත් සංස්කෘතික සන්නිවේදනයක්, සංස්කෘතික සාක්ෂරතාවක් සහ සංස්කෘතික සහජීවනයක් ඇති වනු ඇත.

න්‍යායික සහ සංකල්පීය තලයෙහි මෙම ප්‍රතිපත්ති සකස් කර ගැනීමට වඩා ඒවා ප්‍රායෝගිකව සමාජගත කිරීම දුෂ්කර කාර්යයකි. ප්‍රායෝගිකව මෙන්ම සංකල්පීයව මෙම කාර්යයට උරදිය යුතු මූලික පාර්ශ්ව කිහිපයකි. ඒ ප්‍රබුද්ධ ප්‍රජාව වූ දේශපාලන ප්‍රජාව සහ සිවිල් ප්‍රජාවයි.

සමාජය තුළ ගොඩනැගීමට අපේක්ෂිත අන්තර් සංස්කෘතික සහ

අන්තර්වාර්ගික සංහිඳියාවට පෙර අදාළ පාර්ශ්ව වලට ඇතුළත් සක්‍රිය කොටස් ඊට සරිලන සංස්කෘතිකාවබෝධයකට හා උසස් සංස්කෘතික සවිඥානිකත්වයකට ළඟා විය යුතුය. ශ්‍රී ලංකාව වැනි සමාජවල සමාජ, දේශපාලන නායකත්වයට මෙහිදී පැවරෙන්නේ ඉතා බරපතළ වගකීමකි.

එසේ සංහතික සන්නිවේදන මාධ්‍යයන්ට සුවිශාල කාර්යභාරයක් ඉටු කළ හැකිය. වර්තමාන සමාජයෙහි සියලු ක්ෂේත්‍ර කෙරෙහි තීරණාත්මක බලපෑමක් පමණක් නොව එම ක්ෂේත්‍ර මත සිය නියාමන ආධිපත්‍ය පවා පවත්වා ගෙන යාමේ හැකියාවක් අද්‍යතන සංහතික මාධ්‍ය පද්ධතිය සතු වේ.

සමස්තයක් වශයෙන් සමාජයෙහි මානසිකත්ව, අවස්ථාවාදී පැතිකඩ පාලනය කිරීමේ හා හැසිරවීමේ බලය සංහතික මාධ්‍ය සතුය. වර්තමාන සමාජය අපේක්ෂිත අනාගත ඉලක්කයක් කරා මෙහෙයවීමේදී සහ එහි අනාගත තත්ත්වය සකස් කිරීමෙහි ලා, විශේෂයෙන් ම අන්තර්වාර්ගික සන්නිවේදනයක් ඇති කිරීමෙහි ලා සංහතික මාධ්‍යයට ප්‍රමුඛ භූමිකාවක් පැවරී ඇති බව අවධාරණය කළ යුතුය.

අවසාන වශයෙන් ජාතික සංහිඳියාවක් ඇති කිරීමෙහි ලා සංස්කෘතිකාන්තර අන්තර් හුවමාරුව ශ්‍රී ලංකාව තවමත් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතා සීමිත මට්ටමිනි. එය ප්‍රස්තුත කාර්ය සඳහා වඩාත් යෝග්‍ය සහ තිරසර ප්‍රතිපත්තියක් බව අපගේ අදහසයි. නමුත් මෙය ද සමකාලීන සමාජ ජීවන ක්‍රියාවලිය තුළ දේශපාලන ක්‍රියාවලියෙන් විනිර්මුක්තව සලකා බැලිය හැකි නොවේ. එම නිසා වර්තමාන ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියාව සඳහා ඒකමාර්ගික හෝ ඒකාංගික වැඩපිළිවෙළකට වඩා බහුමාර්ගික හෝ සකලාත්මය සන්නිවේදනාත්මක වැඩපිළිවෙළකට ගමන් කළ යුතුය.